# දැන්වීමයි

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඒකාබද්ධව මෙහෙයවන
දහම් සරසවිය උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2021/2022
**දේශකවරුන් බඳවාගැනීම සඳහා අයදුම්පත් කැඳවීම**

බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය හා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මඟින් දහම් පාසල් ගුරුවරුන් වෙනුවෙන් පවත්වනු ලබන දහම් සරසවිය උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2021/2022 වර්ෂයන් සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මෙහෙයවනු ලැබේ. මෙම පාඨමාලාව කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, මහනුවර, මාතලේ, නුවරඑළිය, අම්පාර, ත්‍රිකුණාමලය, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, මොණරාගල, රත්නපුර සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක 19ක ක්‍රියාත්මක වේ.

**දේශකවරු බඳවාගැනීමට අපේක්ෂිත විෂයයන්:**

01 බුදුදහමෙහි මූලික ඉගැන්වීම් I
02 බෞද්ධ ශිෂ්ටාචාරය I
03 බෞද්ධ අධ්‍යාපනය හා සන්නිවේදනය
04 අභිධර්මය හා බෞද්ධ මනෝවිග්‍රහය
05 පාලි භාෂා ප්‍රවේශය I

**<u>අධ්‍යාපනික සුදුසුකම්</u>**

- බෞද්ධ දර්ශනය/ බෞද්ධ ශිෂ්ටාචාරය/ බෞද්ධ සංස්කෘතිය/ පාලි භාෂාව පිළිබඳ ලබාගත් ගෞරව ශාස්ත්‍රවේදී උපාධිය

හෝ

- බෞද්ධ දර්ශනය/ බෞද්ධ ශිෂ්ටාචාරය/ බෞද්ධ සංස්කෘතිය/ පාලි භාෂාව පිළිබඳ ලබාගත් ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය

හෝ

- වෙනත් විෂයයකින් ලබාගත් පළමු උපාධිය සහ බෞද්ධ දර්ශනය/ බෞද්ධ ශිෂ්ටාචාරය/ බෞද්ධ සංස්කෘතිය/ පාලි භාෂාව පිළිබඳ ලබාගත් පශ්චාද් උපාධිය

හෝ

- ප්‍රාචීන පණ්ඩිත විභාගය සමත්ව තිබීම.

**<u>පළපුරුද්ද</u>**

- ඉගැන්වීමේ කටයුතුවල අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතු ය.

දේශන පවත්වන පැය ගණන සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් පැයකට රුපියල් හත්සියයක අනුමත දීමනාවක් ගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ඉගැන්වීමේ හැකියාව පරීක්ෂා කරනු ඇත. පහත දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව සකසා ගත් අයදුම්පතක් 2021.03.17 දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම්කවරයේ වම් පස ඉහළ කෙළවරේ දේශන පැවැත්වීමට බලාපොරොත්තු වන විෂය සහ දිස්ත්‍රික්කය සටහන් කළ යුතු ය.

**අයදුම්පත් එවිය යුතු ලිපිනයඃ-**

පාඨමාලා සමායෝජක, දහම් සරසවිය උසස් ඩිප්ලෝමා පාඨමාලාව, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.

**(වැඩි විස්තර මහාචාර්ය වසන්ත මෙන්ඩිස් මහතා ඇමතීමෙන් ලබාගත හැකි ය.) - (0714843284)**

ලේඛකාධිකාරි,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.
2021.03.01

| | |
|---|---|
| ඉගැන්වීමට බලාපොරොත්තුවන විෂය : | |
| ඉගැන්වීමට බලාපොරොත්තුවන දිස්ත්‍රික්කය : | |

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඒකාබද්ධව මෙහෙයවන

දහම් සරසවිය උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2021/2022

දේශක තනතුරු සඳහා ආදර්ශ අයදුම්පත්‍රය

1. සම්පූර්ණ නම :-
2. ලිපිනය :-
   (පදිංචිය ග්‍රාම නිලධාරී සහතිකය මගින් සනාථ කළ යුතු ය)
3. දුරකථන අංකය :-
4. උපන් දිනය :- වයස අවු:-
5. ජාතික හැඳුනුම්පත් අංකය :-
6. පැවිදි / ස්ත්‍රී / පුරුෂ / :-
7. දිස්ත්‍රික්කය :-
8. තමන් අයත් ශාසනාරක්ෂක බල මණ්ඩල ප්‍රදේශය :-
9. පදිංචි ස්ථානයට ආසන්නම නගරය :-
10. අධ්‍යාපන සුදුසුකම් :-
11. සති අන්තයේ සෙනසුරාදා දිනවල මෙම කාර්යය සඳහා අඛණ්ඩව යෙදීමට ඉඩ ප්‍රස්ථාව තිබේ ද? :- ඔව් / නැත
12. ඉගැන්වීමේ පළපුරුද්ද:-
13. ඔබ දහම් සරසවිය උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ දේශකවරයෙකු වශයෙන් කටයුතු කර ඇත් ද යන වග :- ඔව් / නැත

මවිසින් ඉහත සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය :- ............................ අයදුම්කරුගේ අත්සන :- .......................................